# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

## பொலிஸ் ஊடகப் பிரிவு

## POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.11.05 පැය 0540 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/1993/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


### පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු

**01. මනුෂ්‍ය ඝාතනයක් - ඊච්චන්කුලම පොලිස් වසම.**

2025.11.04 වන දින උදෑසන කාලයේ ඊච්චන්කුලම පොලිස් වසමේ කල්මඩු ප්‍රදේශයේ නිවසක කාන්තාවක් හිසෙහි තුවාල සහිතව මියගොස් ඇති බවට ඊච්චන්කුලම පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකාරිය වයස අවුරුදු 25 ක් වූ පුම්පුකාර්, කල්මඩු ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෙම මරණකාරිය නිවසේ කාමරයක් තුල කැපුම් තුවාල සහිතව මියගොස් සිට ඇත. නිවසේ සිටි ස්වාමිපුරුෂයා ඔහුගේ දියණිය සමඟ නිවසින් පිටව ගොස් එරාවූර් පොලිස් ස්ථානය වෙත භාර වී ඇති අතර වයස අවුරුදු 33 ක් වන ස්වාමිපුරුෂයා විසින් පවුල් ආරවුලක් හේතුවෙන් මෙම ඝාතනය සිදු කර ඇති බවට දැනට සිදු කරන ලද විමර්ශනයේදි අනාවරණය වී ඇත.

මෘත ශරීරය සිද්ධිය වූ ස්ථානයේ පොලිස් ආරක්ෂාව යටතේ ඇති අතර ඊච්චන්කුලම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. මනුෂ්‍ය ඝාතනයක් - මහඔය පොලිස් වසම.**

2025.11.04 වන දින රාත්‍රී කාලයේ මහඔය පොලිස් වසමේ බොරපොල ප්‍රදේශයේ නිවසක පුද්ගලයෙකු මියගොස් ඇති බවට මහඔය පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 31 ක් වූ සමගිපුර, මහඔය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෙම ඝාතනය සිදු කල සැකකරුගේ බිරිඳ සමඟ මරණකරු අනියම් සම්බන්ධතාවයක් පවත්වා ගෙන ගොස් ඇති අතර මරණකරු සැකකරුගේ බිරිඳ සමඟ නිවසේ සිටියදී, තියුණු ආයුධයකින් පහරදී මෙම ඝාතනය සිදු කර ඇති බවට සිදු කරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත.

මෘත ශරීරය සිද්ධිය වූ ස්ථානයේ පොලිස් ආරක්ෂාව යටතේ ඇති අතර ඝාතනය සම්බන්ධයෙන් වයස අවුරුදු 34 ක් වන සැකකරු අත්අඩංගුවට ගෙන ඇත. මහඔය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. පිස්තෝල වර්ගයේ ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - බස්නාහිර පළාත් දකුණු අපරාධ කොට්ඨාසය.**

2025.11.04 වන දින රාත්‍රී කාලයේ මුල්ලේරියාව පොලිස් වසමේ බාරොන් ජයතිලක මාවත ප්‍රදේශයේදී බස්නාහිර පළාත් දකුණ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර විදෙස් රටක නිෂ්පාදිත පිස්තෝල වර්ගයේ ගිනි අවියක්, එම පතරොම 09 ක් අඩංගු පතරොම් ගැබක් හා අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 12 මිලිග්‍රෑම් 380 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 43 ක් වන වැබඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

බස්නාහිර පළාත් දකුණ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**04. බලපත්‍ර නොමැතිව මැණික් ගරමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - බගවන්තලාව පොලිස් ස්ථානය.**

2025.11.04 වන දින රාත්‍රී කාලයේ බගවන්තලාව පොලිස් වසමේ මෝරාවත්ත ප්‍රදේශයේදී බගවන්තලාව පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර බලපත්‍ර නොමැතිව අනවසරයෙන් මැණික් ගරමින් සිටි සැකකරුවෙකු කැණීම් උපකරණ සමඟ අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 38 ක් වන බගවන්තලාව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

බගවන්තලාව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**05. හදිසි ගින්නක් - වැලිගෙපොල පොලිස් වසම.**

2025.11.04 වන දින රාත්‍රී කාලයේ වැලිගෙපොල නගරයේ පිහිටි හාඩ්වෙයාර් වෙළඳසැලක හදිසි ගින්නක් හටගෙන ඇති බවට වැලිගෙපොල පොලිසියට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

වැලිගෙපොල පොලිසිය, බලංගොඩ ගිනි නිවන ඒකකයේ නිලධාරීන්, යුධ හමුදා නිලධාරීන් හා ප්‍රදේශවාසීන් එක්ව ගින්න මැඩපවත්වා ඇත. ගින්න හේතුවෙන් වෙළඳසැලේ දේපල වලට හානි සිදු වී ඇති අතර තුවාල හෝ ජීවිත හානි කිසිවක් සිදුව නොමැත. ගින්නට හේතුව මෙතෙක් අනාවරණය වී නොමැති අතර වැලිගෙපොල පොලිසිය වැඩිදුර විමර්ශනය සිදුකරනු ලබයි.

**06. මාරක රිය අනතුරක් - වැල්ලම්පිටිය පොලිස් වසම.**

2025.11.04 වන දින අළුයම් කාලයේ වැල්ලම්පිටිය පොලිස් වසමේ තොටළඟ අඹතලේ මාර්ගයේ කිත්තම්පහුව ප්‍රදේශයේදී තොටළඟ දෙස සිට කොහිලවත්ත දෙසට ධාවනය වූ යතුරුපැදියක් මාර්ගයේ නවතා තිබූ ලොරි රථයක පිටුපස ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ යතුරුපැදිකරු කොළඹ ජාතික රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 22 ක් වූ කිත්තම්පහුව, වැල්ලම්පිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පශ්චාත් මරණ පරීක්ෂණයෙන් පසු මෘත ශරීරය ඥාතීන්ට භාර දී ඇත. වැල්ලම්පිටිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 07. මාරක රිය අනතුරක් - කටුවන පොලිස් වසම.

2025.11.04 වන දින උදෑසන කාලයේ කටුවන පොලිස් වසමේ වලස්මුල්ල මිද්දෙණිය මාර්ගයේ තිරුවානාබොරැල්ල ප්‍රදේශයේ වංගුව අසලදී වලස්මුල්ල දෙස සිට මිද්දෙණිය දෙසට ධාවනය වූ මඟී ප්‍රවාහන බස් රථයක් ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි යතුරුපැදියක මුහුණට මුහුණ ගැටීමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ යතුරුපැදිකරු වලස්මුල්ල රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 24 ක් වූ හිඳකරල්දෙණිය, කටුවන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය වලස්මුල්ල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර අනතුරට සම්බන්ධ මඟී ප්‍රවාහන බස් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. කටුවන පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 08. මාරක රිය අනතුරක් - වෙරළබඩ පොලිස් වසම.

2025.11.04 වන දින උදෑසන කාලයේ වෙරළබඩ පොලිස් වසමේ කොළඹ වරාය පරිශ්‍රයේ වයි හන්දිය අසලදී කොළඹ දෙසට ධාවනය වූ කන්ටේනර් රථයක් ඉදිරියෙන් ගමන් කල යතුරුපැදියක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ යතුරුපැදිකරු කොළඹ ජාතික රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 49 ක් වූ පිලියන්දල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය කොළඹ ජාතික රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර අනතුරට සම්බන්ධ කන්ටේනර් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. වෙරළබඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 09. මාරක රිය අනතුරක් - තංගල්ල පොලිස් වසම.

2025.11.04 වන දින රාත්‍රී කාලයේ තංගල්ල පොලිස් වසමේ කොළඹ වැල්ලවාය මාර්ගයේ මොරකැටිආර ප්‍රදේශයේදී දික්වැල්ල දෙස සිට තංගල්ල දෙසට ධාවනය වූ ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් බස් රථයක් මාර්ගය හරහා ගමන් කල පදික පුද්ගලයෙකුගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පදික පුද්ගලයා තංගල්ල රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 43 ක් වූ කොස්වත්ත, සීනිමෝදර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය තංගල්ල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර අනතුරට සම්බන්ධ බස් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. තංගල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**